# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

## 2017 සැප්තැම්බර් මස 19 වන දින පෙ.ව. 9.30 ට

## න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

- **කාර්ය පටිපාටි රීති අංක 31 (අ) 1 හි විධිවිධාන අනුව පිළිතුරු දීමට කල් ගන්නා ලද ප්‍රශ්න:**

**1. • ගරු සුසිල් කිඳෙල්පිටිය මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන,සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2017.08.08 දින සභාව කල් තබන අවස්ථාවේදී අසන ලද ප්‍රශ්නය,** **(ප/vi(1)/17/ADG -06)**

(අ) ප්‍රවාහන අධිකාරියේ ඇතැම් පත්වීම් හා උසස්වීම් අවිධිමත්බව දන්නේද? එම පත්වීම් සභාගත කරන්නේද? නොහැකි නම් මන්ද?

(ආ) වත්මන් සභාපති සිදුකල පත්වීම් හා උසස්වීම් පිළිබඳව විගණන හෝ වෙනත් පරීක්ෂණයක් සිදු කලේද? නිගමන සභාගත කරන්නේද? නොඑසේනම් මන්ද?

(ඇ) පටිපාටියෙන් බාහිර පත්වීම් හා උසස්වීම්වලට සභාපති වගකිවයුතු බව පිළිගන්නේද? නැතිනම් ඒ මන්ද?

(ඈ) වැඩ බැලීමට පත් කල පාලන හා මූල්‍ය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන් සුදුසුකම් සපුරා නැතැයි පිළිගන්නේද? නැත්නම් ඒ මන්ද?

(ඉ) ඔබතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරි ජීවින්ද්‍ර කීර්තිරත්නට පරිපාලන නිලධාරි (ධාවන) තනතුර ලබාදීමට සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වූයේද? නැත්නම් මන්ද?

(ඊ) සභාපති පත් කල ලිපිකරුවෙකු හා කා.සහයකයෙකු අධිකාරියට නොපැමිණ සභාපතිගේ බුලත්සිංහල දේශපාලන කාර්යාලයේ සේවයට යනබව දන්නේද?

(උ) වසර පහක පලපුරුද්ද අවශ්‍ය අභ්‍යන්තර විගණක තනතුරට වසර තුනක පලපුරුද්ද ඇති බුලත්සිංහල අයෙකු හා කොරතුරු පද්ධති සහායක ලෙස ජා-ඇල අයෙකු පත් කලේ දේශපාලන සම්බන්ධකම් මත බව පිළිගන්නේද? පිළිනොගන්නේ නම් මන්ද?

(ඌ) රියදුරු පාසලේ විදුහල්පති උසස්වීම් හා පුහුණු පර්යේෂණ හා සැලසුම් ඒකකයේ කළමනාකරු පත්කිරීම සිදුකලේ විධිමත් පරීක්ෂණ මණ්ඩලයක් නොමැතිව බව දන්නේද? එම මණ්ඩලයේ ලකුණු සභාගත කරන්නේද? නොහැකිනම් මන්ද?

**2.** **ගරු මංජුල ප්‍රසන්න සම්පත් මන්ත්‍රීතුමා විසින් ගරු සෞඛ්‍ය, දේශීය වෛද්‍ය සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සහ කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට;** **(ප්‍ර/vi(1)/17/88)**

(අ)

i. බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ මේ වන විට ඩෙංගු රෝගීන් කී දෙනෙක් වාර්තා වී ඇත්ද?

ii. බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල ඩෙංගු මරණ කීයක් වාර්තා වී ඇත්ද?

iii. බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඩෙංගු උවදුර වැඩිම ග්‍රාමසේවක වසම් මොනවාද?

iv. එයට හේතු වශයෙන් ඔබතුමා ඉදිරිපත් කරන්නේ මොනවාද?

v. බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල දුම් ගැසීම සඳහා යන්ත්‍ර කීයක් තිබේද?

vi. ඒ කුමන ආයතන වලද?

vii. එම යන්ත්‍ර ප්‍රමාණවත්ද?

(ආ)

i. බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ඩෙංගු උවදුර දුරු කිරීම සඳහා ඔබතුමා ගෙන ඇති ඉදිරි පියවර මොනවාද?

ii. ඒ සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබා දෙනවද?

3. ගරු මංජුල ප්‍රසන්න සම්පත් මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (ම/vi(1)/17/89)

(අ)

i. කැලණිය අධ්‍යාපන කලාපයේ තිබෙන මුළු පාසල් සංඛ්‍යාව කොපමණද?

ii. එම පාසල්වල මුළු ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද?

iii. එම පාසල් අතර බාලිකා පාසල් කීයක් තිබේද?

iv. එහි ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද?

v. කැලණිය අධ්‍යාපන කලාපයේ පාසල්වල වැඩ බලන විදුහල්පතිවරු කීදෙනෙක් සිටීද?

(ආ)

i. බියගම කොට්ඨාශයේ පාසල් සිසු දරුවන් අතරින් 2016 වර්ෂයේ විශ්ව විද්‍යාලයට ඇතුල් වීමට කීදෙනෙක් සුදුසුකම් ලබා ඇත්ද?

ii. 2016 වර්ෂයේ උසස් පෙළ විභාගයට පෙනී සිටි සිසු සිසුවියන් සංඛ්‍යාව කීයද?

iii. විෂයයන් සියල්ලම සමත් හා අසමත් සංඛ්‍යාව කොපමණද?

(ඇ)

i. බියගම කොට්ඨාශයේ පාසල් අතරින් 2016 සාමාන්‍ය පෙළ ප්‍රතිඵල අනුව ප්‍රථම, දෙවන, තුන්වන ස්ථාන ලබාගෙන ඇත්තේ කුමන පාසල්ද?

ii. බියගම කොට්ඨාශය තුළ 2016 සාමාන්‍ය පෙළ ප්‍රතිඵල අනුව දුර්වල පාසල් මොනවාද?

iii. 2017 වර්ෂයේ එම විදුහල්වල ප්‍රතිඵල ඉහල නැංවීමට ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ග මොනවාද?

(ඈ)

i. කඳුබොඩ මහා විද්‍යාලයේ 2016 සාමාන්‍ය පෙළ විභාගයට සිසු දරු දැරියන් කී දෙනෙකු ඉදිරිපත් වී ඇත්ද?

ii. කී දෙනෙකු සමත් වී ඇත්ද?

iii. කී දෙනෙකු අසමත් වී ඇත්ද?

iv. 2016 ශිෂ්‍යත්ව විභාගයට කඳුබොඩ මහ විද්‍යාලයෙන් කී දෙනෙකු ඉදිරිපත් වී ඇත්ද? ඉන් කී දෙනෙකු සමත් වී ඇත්ද?

4. ගරු රොයිස් විජිත ප්‍රනාන්දු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට, (ප/vi(1)/17/90)

---

අ. බස්නාහිර පළාතේ ගුරු සේවයට උපාධිධාරින් බඳවාගැනීම සඳහා 2014.12.27 වන දින පවත්වන ලද විභාගයෙන් අපේක්ෂකයන් කී දෙනෙක් සමත්වුවාද?

ආ. එලෙස සමත් වූවන්ගෙන් කී දෙනෙකුට උපාධිධාරී ගුරු පත්වීම් ලබා දුන්නාද?

ඇ. පත්වීම නොලද එහෙත් විභාගය සමත් අපේක්ෂකයන් කීදෙනෙකු පොරොත්තු ලේඛණයේ සිටිනවාද?

ඈ. එම අපේක්ෂක පිරිසට ගුරු පත්වීම ලබාදෙනවාද?

ඉ. එසේ කළ නොහැකි නම් ඊට හේතු කාරණා මොනවාද?

ඊ. බස්නාහිර පළාත තුල උපාධිධාරි ගුරු හිඟයක් පවතින බව ඔබතුමා පිළිගන්නවාද?

උ. එලෙස බස්නාහිර පළාත තුළ ගුරු හිඟය පවතින්නේ

විද්‍යා අංශයේ කොපමණද?

වාණිජ අංශයේ කොපමණද?

කලා අංශයේ කොපමණද?

5. ගරු රොයිස් විජිත ප්‍රනාන්දු මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන,සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට, (ප/vi(1)/17/91)

අ. 1998 අංක 3 දරණ සමුපකාර ප්‍රඥප්තිය උල්ලංඝනය කළ පුද්ගලයන් හතර (4) දෙනෙකු මීගමුව විවිධ සේවා සමුපකාර සමිතියේ අධ්‍යක්ෂක මණ්ඩලයේ කටයුතු කරමින් තනතුරු දැරීම නීත්‍යානුකූලද?

ආ. එකී සමිතියේ හිටපු සභාපති සහ වර්තමාන සභාපති බලප්‍රදේශයෙන් පිටත පදිංචිව සිටින බවට වූ චෝදනාව පරික්ෂා කළ නිළධාරින් තීන්දුව නොදී යටගසා ඇති බව ඔබතුමා දන්නවාද?

ඇ. එකී සමුපකාර සමිතියේ සභාපති බලප්‍රදේශය තුළ මහා පරිමාන ඉන්ධන පිරවුම් හලක් හා හාඩ්වෙයාර් ආයතනයක් හිමිකරුවකු බවට ඇති පැමිණිල්ල විමර්ශනය කරන නිළධාරින් තීන්දුවක් නොදී යටගසා ඇති බව ඔබතුමා දන්නවාද?

ඈ. මෙම සමුපකාර සමිතියේ ටෙන්ඩර් කමිටුවේ සාමාජිකයකු ද, සමිතියේ උප සභාපතිවරයා ද,වන තැනැත්තකු පරිඝණක ආයතනයක කළමණාකරුවෙකු ලෙසද සේවය කරමින් මෙම සමුපකාරය හා එකී පරිඝණක ආයතනය අතර සේවා ගිවිසුමක් අත්සන් කර ඇති බවත්, එය සමිතියේ අතුරු ව්‍යවස්ථාව උල්ලංඝණය වීමක් බවත් ඔබතුමා පිළිගන්නවාද?

ඉ. කල්පසු ණයකරුවකු ලෙස සමිතියෙන් නෙරපූ පුද්ගලයෙකු තවමත් මීගමුව සමුපකාරයේ අධ්‍යක්ෂක වැයෙකු ලෙස රැඳී සිටීම නිතී විරෝධී බව ඔබතුමා පිළිගන්නවාද?

ඊ. එවැනි වරදකරුවන්ට එරෙහිව ගන්නා ක්‍රියා මාර්ගය මොනවාද?

6. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට; (ප්‍ර/vi(1)/17/92)

අ.

i. මීගමුව මහ නගර සභාව විසින් කොච්චිකඩේ, ඕවිටියවත්තට කුණු බැහැර කිරීම ආරම්භ කළේ කවදාදා?

ii. ඒ සඳහා වතුහිමියාගෙන් අවසරයක් තිබේද?

iii. ඒ සඳහා ඔහුට ගෙවීමක් කරන්නේද? මාසිකව කොපමණ මුදලක්ද?

iv. කසල බැහැර කිරීම සඳහා ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කරන්නේද? කවදා සිටද?

v. බැහැර කරන කසල තුනී කිරීමට ක්‍රමවත් වැඩපිළිවෙලක් යොදා තිබේද?

vi. ඒ සඳහා ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කර තිබේද?

vii. ඒ සඳහා කොපමණ මුදලක් මේ දක්වා ගෙවා තිබේද?

viii. මාසිකව කළ ගෙවීම් සභාගත කරන්නේද?

ආ.

i. ඕවිටියාවත්තට බැහැර කරන ලද කසළ වසා දැමීමට පස් දැමීම ආරම්භ කළේ කවදා සිටද?

ii. එදා සිට මේ දක්වා කොපමණ පස් (බොරළු) කියුබ් ප්‍රමාණයක් යොදවා තිබේද?

iii. එක් පස් කියුබ් එකක් සඳහා ගෙවූ මුදල කොපමණද?

iv. මෙතෙක් කොපමණ මුදලක් ගෙවා තිබේද?

v. පස් (බොරළු) දැමීම සඳහා නීත්‍යානුකූල ක්‍රමවේදයක් අනුගමනය කළේ ද?

vi. එය කුමක්ද?

7. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට, (ප/vi(1)/17/93)

අ. i. මීගමුව මහ නගර සභාවේ කසළ බැහැර කිරීමට විරුද්ධව නඩුවක් තිබේද?

ii. මෙතෙක් එම නඩුව සඳහා වැයකළ නීතිඥ ගාස්තු කොපමණද?

ආ. i. එම කැලිකසල බැහැර කිරීම නිසා කොච්චිකඩේ ඕවිටියාවත්ත ප්‍රදේශයේ පරිසර සමතුලිතතාව බිඳ වැටී ඇති බව ඔබතුමා දන්නේද?

ii. එම ප්‍රදේශයේ භූගත ජලය අපවිත්‍ර වී ඇති බව ඔබතුමා පිළිගන්නේද?

iii. එම ප්‍රදේශයට ආසන්නව මහඔයට ගලාබසින කුඩා ඇළ මාර්ගය මෙම කැලිකසල නිසා අපවිත්‍රවන බව ඔබතුමා දන්නේද?

iv. එම ප්‍රදේශයේ මදුරුවන් බෝවීම බහුල වී ඩෙංගු මදුරුවන් ව්‍යාප්තවීම උත්සන්න වී ඇති බව ඔබතුමා දන්නේද?

v. දැඩි දුර්ගන්ධය නිසා ස්වසන ආබාධ වැඩිවී සෞඛ්‍ය ප්‍රශ්න උද්ගතවී ඇති බව ඔබතුමා පිළිගන්නේද?

8. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට, (ප/vi(1)/17/94)

අ. i. මීගමුව මහ නගර සභාවේ කසළ කළමණාකරණය සඳහා යයි පවසමින් විදේශ චාරිකා ගොස් තිබේද? එසේ ගිය අවස්ථා ගණන කීයද?

ii. කිනම් රටවල් සඳහා මෙම සංචාර සංවිධානය කර තිබුණේද?

iii. ඒ අවස්ථා සඳහා සහභාගි වූ අය කව්ද? වැයකළ මුදල කොපමණද?

iv. මෙම සංචාරවලින් ලබාගත් දැනුම භාවිතාකර ව්‍යාපෘති යෝජනා සකස්කර ඉදිරිපත් කර තිබේද?

v. ඒවා සභාගත කරනු ලබන්නේද?

ආ. i. කැලි කසල "ප්‍රතිචක්‍රීකරණය" කිරීම සඳහා යම් ආයතනයක් හෝ බහුජන සංවිධානයක් විකල්ප මාර්ග යෝජනා කර තිබේද?

ii. එසේ නම් එම යෝජනා සභාගත කරන්නේද?

9. ගරු රොයිස් විජිත ප්‍රනාන්දු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට, (ගු/vi(1)/17/95)

අ. මීගමුව මුහුදු වෙරළේ කොටුව පිට්ටනියට උතුරු දෙසින් ප්‍රසිද්ධ මාළු වෙළඳ පොලක් ඇති බව ඔබතුමා දන්නවාද?

ආ. එම වෙළඳ පොල ශ්‍රී ලංකාවට ආධාර සපයන 'ජෙයිකා' නමැති ජාත්‍යන්තර ආයතනයේ ආධාර යටතේ ඉදි කර ඇති බව ඔබතුමා දන්නවාද?

ඇ. මෙලෙස 'ජෙයිකා' ආධාර ලැබුනේ මීගමුව මහ නගර සභාවට ආදායම් උපයා ගන්නට බව පිළිගන්නවාද?

ඈ. එම වෙළඳපොල ආරම්භ වූ දා සිට අද දක්වා වාර්ෂිකව වෙන වෙනම මීගමුව මහ නගර සභාවට ලැබුණු ආදායම් දැන ගැනීමට හැකිද? නොහැකි නම් ඒ මන්ද?

ඉ. එය ඉදිකර තිබෙන්නේ යකඩ පයිප්ප සහ යකඩ සෙවිලි තහඩු යොදාගෙන බව ඔබතුමා දන්නවාද?

ඊ. ඉදිකර වසර 10 ක් ගතවී නොමැති මෙම ගොඩනැගිලි මුහුදු සුළඟට ලක්ව ඛාදනය වී දිරාපත්ව යම් යම් ස්ථාන කඩා වැටී ඇති බව ඔබතුමාට දැන ගන්නට ලැබුණාද?

උ. එම ගොඩනැගිලි මිනිසුන් මතට කඩා වැටී අනතුරක් සිදුවන්නට පෙර මෙම ගොඩනැගිල්ල අළුත්වැඩියා කලයුත්තේ කවුරුන් විසින්ද? නැතහොත් කවර ආයතනයක් මඟින්ද?

## VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

## VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

## VIII. පෞද්ගලික පැහැදිලි කිරීම

## IX. සභාවේ කටයුතු (I)

ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට,

යෝජනාව :

"අද දින න්‍යාය පත්‍රයේ පොදු කටයුතු විෂයය යටතේ අංක (02) හි හා (03) හි සඳහන් වැඩ කටයුතු සඳහා රීති අංක 52(5), 57(1), 57(4) හා 57(5) හි සඳහන් විධිවිධානයන්ගෙන් කිනම් හෝ බාධාවක් සිදු නොවිය යුතු යැයි සළකා ක්‍රියා කළ යුතුය."

## සභාවේ කටයුතු (II)

ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට,

යෝජනාව,

"අද දින පොදු කටයුතු ප්‍රමුඛතාවය ගත යුතුය.

### X . පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

**01. ගරු නිමල් චන්ද්‍රරත්න මන්ත්‍රීතුමා :**

"ශ්‍රී ලංකාවේ රජයන් කලින් කලට වෙනස් වීම මත අධ්‍යාපන ක්ෂේත්‍රයේ ද වෙනස්වීම් සිදු වන බැවින්, ශ්‍රී ලංකාව තුළ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සකස් කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජයෙන් ඉල්ලා සිටියි."

**යෝ /vi(1)/17/05**

**02. ගරු කේ.ඩී. අරුණ දිපාල් මන්ත්‍රීතුමා :**

"ගංවතුර නියං සහ අනෙකුත් ස්වභාවික විපත් අවස්ථාවන්හිදී විපතට පත් වූවන්ට කඩිනමින් සහන සැලසීමේ දී ඇති වන අපහසුතා මගහරවා ගැනීමට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ සමගාමී ලැයිස්තුවේ 7 වන කොටසට අදාළ සහන සහ ක්‍රියාවන් ඉටු කිරීමට ද, දිස්ත්‍රික්ක තුනම ආවරණය වන පරිදි ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන පිහිටවිය යුතු බවත්, ආරම්භයක් ලෙස කළුතර දිස්ත්‍රික්කය සඳහා බණ්ඩාරගම සහ මතුගම මැතිවරණ කොට්ඨාශ දෙකෙහි අදාල මධ්‍යස්ථාන පිහිටුවා ඇවැසි සියළු යන්ත්‍ර, සූත්‍ර, උපකරණ සහ සම්පත් මෙවලම් ලබා දීමට ද කටයුතු කළ යුතුයැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි."

**යෝ /vi(1)/17/06**

### XI. පොදු කටයුතු

**01. ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා (බ.ප) :**

"බස්නාහිර පළාතේ 2017 අංක - දරණ පළාත් පාලන ආයතන බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රඥප්තිය"

[2017.08.22 දින පැවැති සභා රැස්වීමේ වැඩ කටයුතු හා සම්බන්ධිතයි.]

**02.** ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා. (බ.ප);

<u>යෝජනාව</u> :

<u>2017 පරිපූරක ඇස්තමේන්තුව - 01</u>

2017 වර්ෂය සඳහා බස්නාහිර පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කාර්යාල වල මතු දැක්වෙන අවශ්‍යතා වෙනුවෙන්, එනම්,

- වසර 2016 සිට 2020 දක්වා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති, "<u>ළඟම පාසැල හොඳම පාසැල</u>" ව්‍යාපෘතිය වෙනුවෙන් බස්නාහිර පළාත් සභාවට අයත් ඉදිකිරීම් වෙනුවෙන් 2017 වසරට වෙන් කරන ලද රජයේ ප්‍රදාන සඳහා ප්‍රතිපාදන සැලසීමද,

- 2016 වර්ෂයේ නොගෙවූ බිල්පත් පියවීම වෙනුවෙන් 2017 වර්ෂය තුල රජයෙන් ලද ප්‍රදාන පළාත් සංවර්ධන කාර්යයන් සඳහා යෙදවීම වෙනුවෙන් අවශ්‍ය ප්‍රතිපාදන සැලසීමද,

- පළාත් සභාව විසින් ඉදිකිරීමට යෝජිත නිවාඩු නිකේතන වෙනුවෙන් ඉඩම් අත්පත් කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සැලසීමද,

- ලෝක බැංකු ආධාර යටතේ සෞඛ්‍ය ක්ෂේත්‍රය සඳහා පෙර වර්ෂවලදී ලද මුදල් ඉතිරිවීම් 2017 වර්ෂයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා යෙදවීමට ප්‍රතිපාදන සැලසීම ද,

- ගරු පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ වැඩි කළ දීමනා හා සෞඛ්‍ය, ජීවිත හා හදිසි අනතුරු රක්ෂණාවරණ ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සැලසීමද,

- සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ, චක්‍රලේඛ අනුව සංශෝධනය වූ අතිකාල දීමනා සෞඛ්‍ය ආංශික කාර්ය මණ්ඩල වෙත ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සැලසීමද,

- අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව ගුරු හිඟ වැටුප්, දීමනා ගෙවීම හා නව බඳවා ගැනීම් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සැලසීමද,

- සත්ත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුවේ නව බඳවා ගැනීම් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සැලසීමද යන අවශ්‍යතා වෙනුවෙන්,

2017 වර්ෂය සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළ යුතුව ඇති හෙයින්, ඒ සඳහා

- "ළඟම පාසැල හොඳම පාසැල" ව්‍යාපෘතිය වෙනුවෙන් 2017 වසරට වෙන් කරන ලද රජයේ ප්‍රදාන - රු. 5,799, 162,000 ක්,
- **2016 වර්ෂයේ නොගෙවූ බිල්පත් පියවීම වෙනුවෙන්, 2017 වර්ෂය තුල රජයෙන් ල ප්‍රදාන - රු. 1,250,000,000/ ක්,**
- පෙර වර්ෂයන් හිදී ලෝක බැංකු ආධාර යටතේ ලබා දෙන ලද මුදලින් වියදම් නොවී ඉතිරි වූ මුදල් - රු. 90,827,000/- ක්, හා
- පළාත් සභා ආදායමින් රුපියල් 718,634,000/- ක්,

යන පරිදි පියවා ගැනීමට අපේක්ෂිත මුළු ප්‍රතිපාදනය රුපියල් හත් බිලියන අටසිය පනස් අට මිලියන හයසිය විසිතුන් දහසක් (රුපියල් 7,858,623,000/-) වන පරිදි පිළියෙල කරන ලද 2017 පරිපූරක ඇස්තමේන්තුව 01 අනුමත කළ යුතුය. "

**03. ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිස කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා (බ.ප):**

යෝජනාව :

2017 පරිපූරක ඇස්තමේන්තුව - 01 ට අදාල විසර්ජන ප්‍රඥප්තිය

2017 වර්ෂයේ පරිපූරක ඇස්තමේන්තු 01 සඳහා අවශ්‍ය රුපියල් හත් බිලියන අටසිය පනස් අට මිලියන හයසිය විසිතුන් දහසක් (රුපියල් 7,858,623,000/-) වූ මුදල බස්නාහිර පළාත් සභා අරමුදලින් ගෙවීමටත්, එකී බස්නාහිර පළාත් සභා අරමුදලට ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් ප්‍රදාන වශයෙන් හෝ වෙනත් ආකාරයකින් ලැබෙන මුදල් භාර ගැනීමටත් බලය දෙනු ලබන 2017 අංක ------------ දරණ විසර්ජන ප්‍රඥප්තිය අනුමත කළ යුතුය.'

## XII . සභාව කල් තැබීම

2017.09.06 දින .
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

කේ.එච්.ඩී.කේ. සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව